**පෝෂණ තත්ත්වයෙන් අනූන ලාංකීය ජනතාවක් කරා ...**

1920 අග භාගයේ දී, ද සොයිසා බැක්ටීරියානුවේද (වර්තමාන වෛද්‍ය පර්යේෂණ ආයතනය) ආයතනයේ අංශයක් ලෙස, වෛද්‍ය ලූෂන් ඒ නිකලස් මහතාගේ ප්‍රධානත්වයෙන් පෝෂණ අංශයේ ආරම්භය සනිටුහන් විය.අපගේ ආරම්භක පරමාර්ථය වූයේ ශ්‍රී ලාංකීය පෝෂණ තත්ත්වය පිළිබඳ වාර්තා සම්පාදනය කිරීමය. කල් යත්ම අපගේ සමීක්ෂණ හා වාර්තා සැලකිල්ලට ගනිමින් රටේ ආහාර අවශ්‍යතාවය ගණනය කිරීම ,ජාතික වැටුප් තල සකස් කිරීම, ආහාර මුද්දර හා සළාක, සමෘද්ධි, ආදී සහනාධාර වැඩසටහන්ද සකස් කරන ලදී.

අපගේ පර්යේෂණ වලදී ඉතා වැදගත් සොයාගැනීම් කරන ලද අතර ඒවා නිවැරදි කිරීම සඳහා පසු කාලීනව රජයයන් විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

එකල ඉතා සුලබ වූ මන්දපෝෂණ තත්ත්වය පාලනය කිරීම පිණිස අපගේ නිෂ්පාදනයක් වූ "ත්‍රිපෝෂ" මහෝපකාරී වූ අතර එය ජාත්‍යන්තරව,මන්දපෝෂණය පාලනය කිරීම සඳහා වූ හොඳම පරිපූරක ආහාරයක් සේ පිලිගැනේ.

ලාංකීය ආහාර වල සංඝටක ප්‍රමාණ පර්යේෂණාත්මකව සොයා එම වගු සැකසීම, නිර්දේශිත ආහාර වේල් සැකසීම ආදිය අපේ අනෙකුත් ප්‍රමුඛ කාර්යයන් විය. මේ සඳහා අවශ්‍ය ආහාර වල අඩංගු විටමින, ලවණ ආදිය පවා පරීක්ෂා කල හැකි සහතිකලත් දියුණු පර්යේෂණාගාර පහසුකම් හා පුහුණු පර්යේෂකයින් අප සතු වේ.

ශ්‍රී ලාංකීය ප්‍රජාවේ පෝෂණ තත්වය, ආහාර සුරක්ෂිතතාවය හා සනීපාරක්ෂක පහසුකම් ආදිය පිලිබඳ, ලෝකයේ ඕනෑම රටකට නොදෙවෙනි ලෙස මුලු දිවයිනම ආවරණය වන පරිදි විද්‍යාත්මකව රැස් කල යාවත්කාලීන දත්ත සමුදායක් අප සතුය.මේ සඳහා අත්දැකීම් බහුල ක්ෂේත්‍ර පර්යෙෂණ කණ්ඩායම්, දත්ත සකසන්නන් ,විශ්ලේෂකයන්, සංඛ්‍යාලේඛන විද්‍යාඥයින් හා ප්‍රජා වෛද්‍ය විශේෂඥයින් ඇතුළු ජගත් පැසසුමට ලක්වූ කණ්ඩායමක් අප සතුය.

රාජ්‍ය මෙන්ම ,එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන මෙන්ම, රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක වන වැඩසටහන් සැලසුම් කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමටත් මෙම දත්ත බහුලව පදනම් කර ගැනේ.

2009-2010 වකවානුවේ යුධ ගැටුම් වලින් අභ්‍යන්තරව අවතැන්වූ සහෝදර ජන සමූහයේ තිබූ උග්‍ර මන්දපෝෂණ තත්ත්වය ඉතා කෙටිකලක් තුල පාලනය කල ආකාරය වර්තමානයෙදී ලොව පුරා පූර්වාදර්ශයක් සේ සළකනු ලැබේ.

රාජ්‍ය පෝෂණ ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කිරීමේදී උපදේශන සේවා ලබා දීම අප විසින් ඉටුකරන තවත් කාර්යයකි.

ලාංකීය ළමා පරපුරේ විටමින් A, යකඩ හා අයඩින් ඌනතාවයෙන් මිදීම සඳහා අප විසින් කරන ලද පර්යේෂණ , සැළසුම් හා පසු විපරම් මහෝපකාරී විය.එහි ප්‍රතිඵලයක් ලෙස අයඩින් ඌණතාවය තුරන් කිරීමේ කඩඉම කරා අප පැමිණ සිටී.

දශක ගණනාවක් පුරා කරන ලද විවිධාකාර වූ වැඩසටහන් තිබියදී පවා ගැටළුවක්ව පවතින යකඩ ඌණතාවය තුරන් කිරීමේ නවතම ක්‍රියාමාර්ග කරා අපි එළඹෙමින් සිටිමු.

විවිධ සම්මන්ත්‍රණ, මාධ්‍ය හමු, වෙබ් හා බ්ලොග් අඩවි, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මෙන්ම විශේෂිත වූ පෝෂණ තොරතුරු මධ්‍යස්ථානය හරහා පිරිස දැනුවත් කිරීමද අප විසින් සිදු කරන කාර්යයකි.

දේශීය හා විදේශීය ප්‍රථම හා පශ්චාත් උපාධි ආයතන, හෙද හා මහජන සෞඛ්‍ය පුහුණු පාසල් හා විවිධ වෘත්තික ආයතන හා සමීප සබඳතා පවත්වා ගනිමින් එම සිසුන් හා වෘත්තිකයන් පුහුණු කිරිම සඳහා න්‍යායත්මක හා ප්‍රායෝගික යන දෙ අංශයෙන්ම සම්පත් දායකයන් ලෙසද අපි කටයුතු කරමු.

සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ සියළු අංශ හා අනෙකුත් ක්ෂේත්‍රද එක්ව පෝෂණීය ලාංකීය ජනතාවක් බිහිකිරීමෙහිලා මෙතෙක් අප ආ ගමනේ ලබාගත් ජයග්‍රහණ අතිමහත්ය. අපගේ ශක්තීන් පෙරදැරිව වඩාත් පැහැබර අනාගතය කරා ගමන් කරමින් අප අරමුණු ලඟා කර ගැනීම  අපගේ ඒකායන අරමුණයි.